# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දේශීය ආදායම් (සංශෝධන)

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් 2022 ඔක්තෝබර් මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ඔක්තෝබර් මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[158 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 70.00** **තැපැල් ගාස්තුව : රු. 35.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වගන්තියේ විෂය පථය වැඩි කිරීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වගන්තියේ විෂය පථය වැඩි කිරීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වගන්තියේ විෂය පථය වැඩි කිරීම වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රාග්ධන දීමනාව ගණනය කිරීමේදී ක්ෂය විය හැකි වත්කම්වල පිරිවැය සීමා කිරීම වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඉදිරියට ගෙන ආ මූල්‍ය පිරිවැය සඳහා වූ සීමාව ගණනය කිරීම සඳහා පදනමක් හඳුන්වා දීම වේ.

***8 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු ගෙවීමෙන් නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී සංශෝධිත ක්‍රමවේදයක් සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තියේ විෂය පථය වැඩි කිරීම වේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ හවුල් ව්‍යාපාරයේ ආදායම හෝ පාඩුව ගණනය කිරීමේ දී වෙනත් ආදායම් ද සලකා බැලීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ "ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද විධාන" යන අර්ථ නිරූපණයේ විෂය පථය පුළුල් කිරීම වේ.

***12 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***14 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් යම් ආයතනයක් විසින් කරන ලද ගෙවීම් මූලාශ්‍රයක් ලෙස ඇතුළත් කිරීම වේ.

*15 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වගන්තියේ විෂය පථය වැඩි කිරීම වේ.

*16 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වගන්තියේ විෂය පථය වැඩි කිරීම වේ.

*17 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තියේ අදාළත්වය පුළුල් කිරීම වේ.

*18 වන වගන්තිය:* මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*19 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වගන්තියේ විෂය පථය වැඩි කිරීම වේ.

*20 වන වගන්තිය:* මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*21 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 92අ වන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ගෙවිය යුතු බදු මුදල, සහකාර කොමසාරිස්වරයා විසින් ඇස්තමේන්තු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*22 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගෙවා ඇති සේවා නියුක්තයන් ආදායම් වාර්තාව භාරදීමෙන් බැහැර කිරීම වේ.

*23 වන වගන්තිය:* මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*24 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඒ වගන්තියේ අදාළත්වය පුළුල් කිරීම වේ.

*25 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් දැන්වීම් භාරදීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*26 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 25 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*27 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 25 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*28 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ස්වයං-තක්සේරු වාර්තාවක් සංශෝධනය කිරීම සඳහා ඉල්ලීමක් භාරදීම සඳහා නිශ්චිත කාල සීමාවක් දැක්වීම වේ.

*29 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඒ වගන්තියේ අදාළත්වය පුළුල් කිරීම වේ.

*30 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 25 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*31 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ගෙවීම් පැහැර හැර ඇති බදු ආපසු අයකර ගැනීම සඳහා කාලය දීර්ඝ කිරීම වේ.

*32 වන වගන්තිය:* මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 176 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*33 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 179 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

*34 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 182 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ පනත මගින් නියමකර ඇති පරිදි නිසි ගිණුම්, වාර්තා හෝ ලේඛන පවත්වාගෙන යෑම සඳහා බදු ගෙවන්නන් සඳහා අනිවාර්ය විධිවිධාන හඳුන්වාදීම වේ.

*35 වන වගන්තිය:* මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*36 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතියේ බලපෑම වනුයේ විවිධ ලැබීම් සහ ආදායම් සඳහා විවිධ බදු අනුපාතික නිශ්චිතව දැක්වීම වේ.

*37 වන වගන්තිය:* මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

*38 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ලැබීම්, ලාභ සහ ආදායම් මත බදු නිදහසක් ප්‍රදානය කිරීම වේ.

*39 වන වගන්තිය:* මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

*40 වන වගන්තිය:* මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

*41 වන වගන්තිය :* මේ වගන්තිය මගින් 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා පළමු මාස හය සහ දෙවන මාස හය වශයෙන් තක්සේරු වර්ෂයේ කාලසීමා දෙකකට වෙන්වෙන් වශයෙන් ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

## දේශීය ආදායම් (සංශෝධන)

එල්.ඩී.-ඕ. 7/2022

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2022 අංක දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) (*'අ'* වගුවේ, *'ආ'* වගුවේ සහ *'ඇ'* වගුවේ සඳහන් වගන්තිවල විධිවිධාන හැර) මේ පනතේ විධිවිධාන, කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව මේ පනතෙහි සටහන් කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) *'අ'* වගුවේ සඳහන් වගන්තිවල විධිවිධාන, 2022 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(4) *'ආ'* වගුවේ සඳහන් වගන්තිවල විධිවිධාන, 2022 ඔක්තෝබර් මස 1 වන දින සිට ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(5) *'ඇ'* වගුවේ සඳහන් වගන්තිවල විධිවිධාන, ඒ වගුවේ නිශ්චිතව දක්වා ඇති අදාළ දිනවල දී ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

2017 අංක 24 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "ගෙවනු ලබන වියදම්" යන වචන වෙනුවට "කරනු ලබන ගෙවීම්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "විශ්‍රාම යාමේ දී ලැබෙන මුදල්" යන වචන වෙනුවට "ලැබුණු විශ්‍රාම ගෙවීම්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (එ) ඡේදයේ "ලද ත්‍යාග ඇතුළු වෙනත් ගෙවීම්;" යන වචන වෙනුවට "ලැබුණු ත්‍යාග ඇතුළු වෙනත් ගෙවීම්; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "අවස්ථාවේ වටිනාකම; සහ" යන වචන වෙනුවට "අවස්ථාවේ වටිනාකම;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "සේවායෝජකයා විසින් ගෙවනු ලබන දායක මුදල්" යන වචන වෙනුවට "සේවායෝජකයා විසින් ගෙවනු ලබන දායක මුදල්; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(උ) ආදායම් බදු ගෙවීමේ කාර්ය සඳහා අදාළ විශ්‍රාම දායක මුදල් දැනටමත් සලකා බලා ඇති බවට සහ පසුගිය තක්සේරු වර්ෂයක දී එම දායක මුදල් මත සේවා නියුක්තිකයා විසින් බදු ගෙවා ඇති බවට වූ කොන්දේසියට යටත්ව, සේවා නියුක්තියෙන් විශ්‍රාම යන අවස්ථාවේ දී ලැබෙන යම් විශ්‍රාම ගෙවීමක්.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයේ "තැනැත්තාගේ වියදම්;" යන වචන වෙනුවට "තැනැත්තාගේ වියදම් හෝ වෙනත් යම් අඩු කිරීම්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ඡේදයේ (x) වන අනුඡේදයේ "බදු හෝ වෙනත් අයකිරීම්." යන වචන වෙනුවට "බදු හෝ වෙනත් අයකිරීම්

සහ වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව යම් තැනැත්තකුගේ ආදායම ගණනය කිරීමේ දී අඩුකිරීමට ඉඩ ලබා දී නොමැති යම් බදු හෝ අයකිරීම්.” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (අ) ඡේදයේ “එම ණය බැඳීම මුදල් ණයට ගැනීමේ දී දරනු ලැබූ අවස්ථාවක, එම මුදල් එම වර්ෂය තුළ භාවිත කරන ලද තාක් දුරට හෝ එම වර්ෂය තුළ ආදායම උත්පාදනය කිරීමේ දී වත්කමක් අත්කර ගැනීමට එම මුදල්” යන වචන වෙනුවට “එම ණය බැඳීම යටතේ ණයට ගත් මුදල් එම වර්ෂය තුළ දී ආදායම උත්පාදනය කිරීමේ දී භාවිත කරන ලද වත්කමක් අත්කර ගැනීමට” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය, ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

“(4) ක්ෂය විය හැකි වත්කමක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් ලිඛිත වටිනාකම ශූන්‍ය වන අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තියේ සඳහන් වැඩිදියුණු කිරීම් සඳහා වූ අඩුකිරීම -

(අ) වියදම් දරනු ලැබූ තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන, 4 වන පන්තියේ ක්ෂය විය හැකි වත්කමක් වෙනුවෙන් තක්සේරු වර්ෂ දොළහක් සඳහා;

(ආ) වියදම් දරනු ලැබූ තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන, වෙනත් පංතිවල ක්ෂය විය හැකි වත්කම් වෙනුවෙන් තක්සේරු වර්ෂ තුනක් සඳහා,

සමාන ප්‍රමාණවලින් බෙදා අඩු කරනු ලැබිය යුතු ය.”.

*ප්‍රධාන පනතේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(2) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(3) වන සහ (3අ) වන උපවගන්තිවලට යටත්ව, (2) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(3අ) ක්ෂය විය හැකි වත්කමක් සම්බන්ධයෙන් මේ පනතේ හතරවන උපලේඛනය යටතේ ප්‍රදානය කරනු ලබන සහ ගණනය කරනු ලබන ප්‍රාග්ධන දීමනාවල එකතුව කවර හෝ අවස්ථානුගත කරුණක් යටතේ එම ක්ෂය විය හැකි වත්කම්වල පිරිවැය නො ඉක්මවිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම*

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1) (අ) 2021 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ව්‍යාපාරයක් කරගෙන යාමේ දී හෝ ආයෝජනයක් කිරීමේ දී (මූල්‍ය ආයතනයක් නොවන) යම් අස්තිත්වයක් ලබන ආදායම ගණනය කිරීමේ දී අඩුකරනු ලබන මූල්‍ය පිරිවැය ප්‍රමාණය, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සීමාව ඇතුළත යම් මූල්‍ය සාධනපත්‍ර සඳහා ආරෝපණය කළ හැකි මූල්‍ය පිරිවැය ප්‍රමාණය නො ඉක්මවිය යුතු ය;

(ආ) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යාපාරයක් කරගෙන යාමේ දී හෝ ආයෝජනයක් කිරීමේ දී ශ්‍රී ලංකාව තුළ හෝ

ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සහ තක්සේරු වර්ෂය අවසන් වන දිනයේ දී නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයක් සහිත (මූල්‍ය ආයතනයක් නොවන) සමාගමක් ලබන ආදායම ගණනය කිරීමේ දී අඩුකරන ලද මූල්‍ය පිරිවැය ප්‍රමාණය, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සීමාව නො ඉක්මවිය යුතු ය.

(2) එම සීමාව පහත දැක්වෙන සූත්‍රයට අනුව ගණනය කරනු ලැබිය යුතු ය:-

(අ) $A \times B$

මෙම සූත්‍රයෙහි -

'A' යනු, අස්ථිත්වයේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල මුළු එකතුව වේ; සහ

'B' යනු -

(i) නිෂ්පාදන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී අංක 3 වේ; සහ

(ii) නිෂ්පාදන අස්ථිත්වයක් නොවන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී අංක 4 වේ;

(ආ) $\frac{A}{B} \times C$

මෙම සූත්‍රයෙහි -

'A' = වර්ෂයේ මූල්‍ය පිරිවැය;

'B' = වර්ෂය තුළ දී දරන ලද මූල්‍ය පිරිවැය මත වූ මූල්‍ය සාධනපත්‍රවල වටිනාකම; සහ

'C' = 4 x වර්ෂය අවසානයේ දී සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල මුළු එකතුව,

වේ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "භාවිත නොකළ සීමාවේ ප්‍රමාණයට පමණි." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"භාවිත නොකළ සීමාවේ ප්‍රමාණයට පමණි:

එසේ වුව ද, වර්ෂය තුළ දී දරන ලද මූල්‍ය පිරිවැයක් නොමැති අවස්ථාවක ඉහත කී කාර්යය සඳහා භාවිත නොකළ සීමාව ගණනය කිරීමේ දී, ඊට පෙරාතුව ම වූ වර්ෂයේ මුදල් ප්‍රමාණයන් යනා දී ලෙස භාවිත කරමින්, (2) වන උපවගන්තියේ සඳහන් සීමාව ගණනය කරනු ලැබිය යුතු ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ උපවගන්තියේ (3) වන උපවගන්තියේ, "නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී පමණක් අඩු කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී පමණක් අඩුකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකුට ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පාඩුවක් සිදු වී ඇති අවස්ථාවක, එය ලාභයක් වී නම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයක් අනුව බදු අය කළ හැකි නම් සහ ඒ අනුප්‍රමාණය පසුව වැඩි කරනු ලැබී නම්, ඒ පාඩුව අඩු අනුප්‍රමාණයක් මත බදු අයකළ හැකි පාඩුවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ -

(අ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "පමණක් අඩුකරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "පමණක් අඩුකරනු ලැබිය යුතු ය; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් -

"(ඇ) ආයෝජනයකින් සිදුවන හිලව් නොකළ පාඩු, ඒ පාඩු සිදු වූ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ පළමුවන දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂ හය ඇතුළත පමණක් අඩු කරනු ලැබිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "ලැබීමකින් වෙනත් ආයෝජන වත්කමක් බැහැර කිරීමේ දී සිදුවන යම් පාඩුවක් අඩු කරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "ලැබීමකින් යම් පාඩුවක් අඩුකරනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එම වගන්තියේ (5) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) පැවරීම සිදුකරන අවස්ථාවේ දී -

(i) 2021 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව -

(iඅ) තැනැත්තා සහ ආශ්‍රිතයා වාසිකයන් වීම;

(iආ) ආශ්‍රිතයා හෝ ආශ්‍රිත හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී එහි කිසිදු හවුල්කරුවකු හෝ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් නොවීම; සහ

(ii) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව -

(iiඅ) තැනැත්තා සහ ආශ්‍රිතයන් වාසිකයන් වීම;

(iiආ) ආශ්‍රිත හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එහි කිසිදු හවුල්කරුවකු හෝ ආශ්‍රිතයා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් නොවීම;

(iiඇ) (4) වන උපවගන්තියේ සඳහන් වත්කමක් උපලබ්ධි කිරීමෙන් තැනැත්තකුට ලැබෙන ලැබීම් මත අදාළ වන බදු අනුප්‍රමාණය එම වත්කම උපලබ්ධි කිරීමෙන් ආශ්‍රිතයාට ලැබෙන ලැබීම් මත අදාළ වන බදු අනුප්‍රමාණයට වඩා අඩු නොවීම; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එම තක්සේරු වර්ෂය සඳහා එහි ව්‍යාපාර කටයුතු හෝ ආයෝජන මගින් ලැබෙන හවුල් ව්‍යාපාරයේ ආදායම විය යුතු ය (6 වන සහ 7 වන වගන්ති)." යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම තක්සේරු වර්ෂය සඳහා එහි ව්‍යාපාර කටයුතු ආයෝජන හෝ වෙනත් ආදායම් මගින් ලැබෙන හවුල් ව්‍යාපාරයේ ආදායම විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "1988 අංක 30 දරන බැංකු පනතේ 76ඒ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බොල් ණය සහ අඩමාන ණය සම්බන්ධයෙන් ඒ ඒ තක්සේරු වර්ෂයට අදාළ වන විශේෂ විධිවිධාන සැලසීමට නිකුත් කරන ලද'' යන වචන සහ ඉලක්කම් වෙනුවට "1988 අංක 30 දරන බැංකු පනතේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 46අ වන වගන්තිය සහ 76ඒ වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින්, හෝ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල යටතේ ණය පහසුකම් වර්ගීකරණය කිරීම, හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම් හෝ එහි" යන වචන වෙනුවට "එහි ලියාපදිංචි හෝ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන පනතේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(3) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම වෙනුවට "(2) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "ගෙවා ඇත්නම්; හෝ" යන වචන වෙනුවට "ගෙවා ඇත්නම්;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "ගෙවා ඇත්නම්;" යන වචන වෙනුවට "ගෙවා ඇත්නම්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:-

"(iii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් යම් ආයතනයක් විසින් කරන ලද ගෙවීම් ඇතුළුව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙවා ඇත්නම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2020 අප්‍රේල් මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 අප්‍රේල් මස 1 වන දින සිට එහෙත් මේ (සංශෝධන) පනත ආරම්භ වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි, යම් සේවායෝජකයකු විසින් ස්වකීය සේවානියුක්තයා වෙත කරන ලද 5 වන

වගන්තිය යටතට ගැනෙන යම් ගෙවීමක් මත මේ (සංශෝධන) පනත ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි එම සේවායෝජකයකු විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩුකරනු ලැබිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන උපවගන්තිය හෝ (1අ) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2020 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 අප්‍රේල් මස 1 වන දින සිට එහෙත් මේ (සංශෝධන) පනත ආරම්භ වන දිනයට පෙරාතුව බලාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) 83අ වන වගන්තියට සහ 84 වන වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, මේ (සංශෝධන) පනත ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි, මේ පනතේ පළමුවන උපලේඛනයේ 10 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති අනුප්‍රමාණය යටතේ, ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් ලාභාංශයක්, පොලියක්, වට්ටමක්, ගාස්තුවක්, ස්වභාවික සම්පත් ගෙවීමක්, කුලියක්, රාජ්‍ය භාගයක් හෝ වාරික මුදලක් ගෙවීමකින් යම් තැනැත්තකු විසින් අත්තිකාරම් ආදායම් බද්ද අඩුකරනු ලැබිය යුතු ය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියේ "යම් තැනැත්තකු විසින්" යන වචන වෙනුවට "යම් තැනැත්තකු විසින් මේ

(සංශෝධන) පනත ආරම්භ වන දිනයට පෙරාතුව" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1ආ) (2) වන සහ (3) වන උපවගන්තිවලට යටත්ව, මේ (සංශෝධන) පනත ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි, යම් තැනැත්තකු විසින් නිර්වාසික තැනැත්තකුට ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් සේවා ගාස්තුවක් හෝ රක්ෂණ වාරික මුදලක් ගෙවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් එම ගෙවීම් මුදලින් 14%ක අනුප්‍රමාණයක් මත බද්ද රඳවා ගනු ලැබිය යුතු ය.

(1ඇ) (3) වන උපවගන්තියට යටත්ව, මේ (සංශෝධන) පනත ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි, ගෙවීම් කරන තැනැත්තාගේ සේවානියුක්තයකු නොවන වාසික පුද්ගලයකුට -

(අ) ඉගැන්වීම, දේශන පැවැත්වීම, විභාග පැවැත්වීම, හෝ විභාගයක් සමීක්ෂණය හෝ අධීක්ෂණය කිරීම වෙනුවෙන්;

(ආ) වාසික රක්ෂණ, අලෙවි හෝ ප්‍රචාරක නියෝජිතයකුට යම් කොමිස් මුදලක් හෝ තැරැව් ගාස්තුවක් වශයෙන්; හෝ

(ඇ) වෛද්‍යවරයකු, ඉංජිනේරුවරයකු, ගණකාධිකාරීවරයකු, නීතිඥවරයකු, මෘදුකාංග සංවර්ධකයකු, පර්යේෂකයකු, ශාස්ත්‍රඥයකු හෝ නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ස්වාධීන සේවා සපයන පුද්ගලයකු වැනි ස්වාධීන සේවා සපයන්නකුගේ තත්ත්වයෙන් ඒ පුද්ගලයා විසින් සපයනු ලබන සේවා වෙනුවෙන්,

ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් සේවා ගාස්තුවක් ගෙවනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා විසින්

එම ගෙවීම් මුදලින් 5%ක අනුප්‍රමාණයක් මත බද්ද රඳවාගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මාසයකට රු. 100,000ක් නො ඉක්මවන සේවා ගෙවීමක් සඳහා මේ උපවගන්තිය අදාළ නොවිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ "83 වන වගන්තිය;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය, 83අ වන වගන්තිය හෝ 84අ වන වගන්තිය;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "83 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය හෝ 83අ වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අඅ) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී හෝ ඉන් පසුව, වාසික සමාගමක් විසින් ගෙවන ලද ලාභාංශ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "83 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම්වල සිට ඒ වගන්තියේ අවසානය තෙක් ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ආ) 83 වන වගන්තිය හෝ 83අ වන වගන්තිය යටතේ සේවායෝජකයා විසින් බදු රඳවා ගැනීම අවශ්‍ය නොවන සේවා නියුක්තියකින්,

තක්සේරු කළ හැකි ආදායමක් උපයනු ලබයි නම් හෝ ඉපයීමට අපේක්ෂා කරයි නම් එම තැනැත්තා විසින් ත්‍රෛමාසික වාරික මගින් බද්ද ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, තක්සේරු වර්ෂයක් තුළ දී ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමෙන් උපචිත වන හෝ උපචිත

වනු ඇතැයි අපේක්ෂිත ලැබීම්, ත්‍රෛමාසික වාරිකවල කාර්යය සඳහා සලකා බලනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 92අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යః-

“ගෙවිය යුතු බදු මුදල සහකාර කොමසාරිස්වරයා විසින් ඇස්තමේන්තු කරනු ලැබිය හැකි බව

**92අ.** (1) 91 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි බදු මුදල පිළිබඳ ඇස්තමේන්තුවක් ගොනු කිරීමට යම් තැනැත්තකු අපොහොසත් වී ඇති අවස්ථාවක දී, සහකාර කොමසාරිස්වරයකු විසින්, ඒ ඇස්තමේන්තුව සපයන ලෙස සහ ඒ ඇස්තමේන්තුව සිදු කිරීමට අවශ්‍ය බවට එම සහකාර කොමසාරිස්වරයා සලකනු ලබන වෙනත් යම් තොරතුරු සපයන ලෙස ලිඛිත දැන්වීමක් එම තැනැත්තා වෙත භාරදෙනු ලැබිය හැකි ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද දැන්වීම මගින් නියම කර ඇති පරිදි බදු මුදල පිළිබඳ ඇස්තමේන්තුවක් ගොනු කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක දී; හෝ

(ආ) පෙරාතුවම වූ තක්සේරු වර්ෂයේ දී වාරික මගින් සහ තක්සේරු කිරීම මත ගෙවිය යුතු මුළු බදු මුදලට වඩා අඩු බදු මුදල් ප්‍රමාණයක් ගෙවිය යුතු ඇස්තමේන්තුගත ආදායම් බදු මුදල වශයෙන් සඳහන් කරමින් යම් තැනැත්තකු විසින් බදු මුදල පිළිබඳ ඇස්තමේන්තුවක් ගොනුකර ඇති අවස්ථාවක දී සහ එම ඇස්තමේන්තුව ඔප්පු කිරීමට අපොහොසත් වී ඇති අවස්ථාවක දී,

පවත්නා සාක්ෂි මත පදනම්ව සහ තමාගේ සුදුසුම විනිශ්චයට අනුව තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තා විසින් ගෙවිය යුතු ඇස්තමේන්තුගත බදු මුදල සඳහන් කරමින්, සහකාර කොමසාරිස්වරයා

විසින් එම තැනැත්තා වෙත බදු මුදල පිළිබඳ ඇස්තමේන්තුවක් භාර දෙනු ලැබිය හැකි ය.

(3) සහකාර කොමසාරිස්වරයා විසින් (2) වන උපවගන්තියේ සඳහන් ඔහුගේ ඇස්තමේන්තුව හතරවන බදු වාරිකය ගෙවීමේ දිනයට පෙරාතුව, එහෙත් පළමුවන බදු වාරිකය ගෙවීමේ දිනයට පසුව භාරදෙනු ලැබිය යුතු ය.

(4) සහකාර කොමසාරිස්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ ඇස්තමේන්තුවක් භාර දී ඇති අවස්ථාවක දී, එම ඇස්තමේන්තුව, ඇස්තමේන්තුවක් වශයෙන් හෝ සංශෝධිත ඇස්තමේන්තුවක් වශයෙන් බලාත්මකව පැවතිය යුතු ය.".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "නිර්වාසික තැනැත්තකු," යන වචන වෙනුවට "නිර්වාසික තැනැත්තකු; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) සේවායෝජකයා විසින් 83අ වන වගන්තිය යටතේ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩුකර ඇති අවස්ථාවක දී සහ 82 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදය යටතේ කිසිදු බදු මුදලක් ගෙවනු නොලැබිය යුතු අවස්ථාවක දී, (2) වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බදු මුදල සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමට පමණක් අදාළ වන යම් පුද්ගලයකු,"; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "යම් සේවා නියුක්තියක් නතර කරන ලද අවස්ථාවක දී" යන වචන වෙනුවට "යම් සේවා නියුක්තියක් නතර කරන ලද අවස්ථාවක දී හෝ 83අ වගන්තිය යටතේ එම තැනැත්තාගේ සේවායෝජකයා විසින් ඔහුගේ සේවා නියුක්ති ආදායම මත අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කරනු ලැබ ඇති අවස්ථාවක දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ, "මූල්‍ය ප්‍රකාශන සකස් කර පවත්වාගෙන යා යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කිරීම

"මූල්‍ය ප්‍රකාශන සකස් කර පවත්වාගෙන යා යුතු ය:

එසේ වුව ද, එම තැනැත්තා විසින් සියලුම ව්‍යාපාර හෝ ආයෝජන කටයුතු සම්බන්ධයෙන් පොදුවේ වියදම් දරා ඇති අවස්ථාවක දී හෝ පොදුවේ යම් වත්කම් භාවිත කර ඇති අවස්ථාවක දී සහ මෙම උපවගන්තියේ කාර්යය සඳහා යම් වියදමක් හෝ අඩුකිරීම් වෙන්ව හඳුනා ගනු ලැබිය නොහැකි අවස්ථාවක දී, ඒ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී (පිරිවැටුමේ අනුපාතයට අනුව හෝ වත්කම් භාවිත කිරීමේ අනුපාතයට අනුව) අනුපාතික පදනමක් මත එම වියදම් හෝ අඩුකිරීම් බෙදා දැක්වීම නීත්‍යානුකූල විය යුතු ය.".

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සාධාරණ ලිඛිත දැන්වීමක් ලබා දීම මගින්," යන වචන වෙනුවට "සාධාරණ දැන්වීමක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ලබා දීම මගින්," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(6) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ගේ නම්, ලිපිනයන් හෝ ජාතික හැඳුනුම්පත් අංක සපයන ලෙස මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත නියම කරනු ලැබිය හැකි අතර, එම තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයීම හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් බදු නිලධරයකු වෙත මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයේ පවතින වාර්තා වෙත ප්‍රවේශය ලබා දීම මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(7) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සමඟ ලියාපදිංචි වී ඇති සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ලිපිනයන් ඇතුළුව අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් සිදුවන අදාළ වෙනස් වීම් පිළිබඳ හෝ අලුත් පත්වීම් පිළිබඳ තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා වෙත සෑම මාස හයකට ම වරක් සපයනු ලැබිය යුතු ය.".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ලිඛිත දැන්වීමක් සහිතව," යන වචන වෙනුවට "දැන්වීමක් සහිතව ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය සංශෝධනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "ලිඛිත දැන්වීමක් සහිතව," යන වචන වෙනුවට "දැන්වීමක් සහිතව ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තිය සංශෝධනය කිරීම

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "දැන්වීමක්, ලිඛිතව," යන වචන වෙනුවට "දැන්වීමක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්," යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "135 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 135 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ සහ 2022 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ස්වයං තක්සේරු වාර්තාව ගොනු කරනු ලැබූ දින සිට මාස දොළහක කාලසීමාවක් තුළ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය සංශෝධනය කිරීම

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "දින තිහකට පසු නොවන දිනයක් තුළ" යන වචන වෙනුවට "දින තිහකට පසු නොවන දිනයක් තුළ හෝ එම ඉල්ලීම 2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, වැඩ කරන දින දාහතරකට පසු නොවන දිනයක් තුළ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "දින තිහක් ඇතුළත, ලද බවට" යන වචන වෙනුවට "දින තිහක් ඇතුළත හෝ එම ඉල්ලීම 2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, වැඩ කරන දින දාහතරකට පසු නොවන දිනයක් තුළ ලද බවට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදයේ "ලිඛිතව" යන වචනය වෙනුවට "ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන්.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "ලිඛිතව" යන වචනය වෙනුවට "ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය සංශෝධනය කිරීම
.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම

"(5) (3) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ දිනය වන විට ගෙවීමට ඇති බදු මුදල් ප්‍රමාණය, යම් දණ්ඩනයක් හා පොලී මුදලක් සහ එම සහතිකයේ දිනයේ සිට නඩු තීන්දුවේ දිනය දක්වා සහතිකයේ සඳහන් මුදල මත අයවිය යුතු නෛතික පොලිය, කොමසාරිස් ජනරාල්වරයා වෙත අයවිය යුතු සහ ගෙවිය යුතු බදු මුදල විය යුතු ය.

(6) මේ (සංශෝධන) පනත ආරම්භ වන දින හෝ එදිනට පසුව මේ වගන්තිය යටතේ පවරනු ලබන නඩු කටයුතු, (3) වන උපවගන්තියේ සඳහන් සහතිකය ඉදිරිපත් කිරීමේ දිනයේ සිට මාස තිහක කාලයක් ඇතුළත සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.".

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 176 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 176 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) බද්දක් තක්සේරු කිරීම, ගෙවීම, එකතු කිරීම සහ බද්දකට අදාළ ආරවුලක් සඳහා වන කාර්ය පටිපාටි බද්දකට අදාළ දණ්ඩනවලට ද එක හා සමානව අදාළ විය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(6අ) (6) වන උපවගන්තියේ කාර්ය සඳහා, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමේ දී, ගෙවිය යුතු බදු මුදල සහ පොලිය ද සමඟ මෙම පරිච්ඡේදය යටතේ අයකරනු ලබන දණ්ඩන මුදල සඳහන් කරමින් තනි තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 179 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 179 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ගෙවිය යුතු දිනයෙන් දින දාහතරක් ඇතුළත ගෙවීමට හෝ පසුව ගෙවන්නේ නම් තක්සේරු දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනය වන විට ගෙවීමට අපොහොසත් වන" යන වචන වෙනුවට "ගෙවිය යුතු දිනයෙන් දින දාහතරක් ඇතුළත ගෙවීමට අපොහොසත් වන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(4) (3) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අභියාචනයක තීරණය ලබාදීමට නියමිතව පවතින අතරතුර දී යම් සංශෝධිත හෝ අතිරේක තක්සේරුවක් සම්බන්ධයෙන් 151 වන වගන්තිය යටතේ ගෙවීම් කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලය දීර්ඝ කිරීම පිළිබඳව නොසලකමින්, යම් තැනැත්තකු ඒ සංශෝධිත හෝ අතිරේක තක්සේරුව මත ගෙවීමට නියමිත ප්‍රමාද වූ ගෙවීම් සඳහා වූ දඩය ගෙවීමට යටත් විය යුතු ය.".

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 182 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 182 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනත මගින් නියම කර ඇති පරිදි" යන වචන වෙනුවට "2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත මගින් නියම කර ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1ආ) 2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත මගින් නියම කර ඇති පරිදි නිසි ගිණුම්, වාර්තා හෝ ලේඛන පවත්වාගෙන යාමට

අපොහොසත් වන යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ගණනය කරනු ලබන දණ්ඩනයක් සඳහා යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ "අපනයන" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "නිශ්චිත ව්‍යවසායක්" යන වචන වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව නිශ්චිත ව්‍යවසායක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (ඇ) ඡේදයේ "එම තැනැත්තාගේ හෝ එම ආශ්‍රිතයාගේ" යන වචන වෙනුවට "එම තැනැත්තාගේ සහ එම ආශ්‍රිතයාගේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ "නිශ්චිත ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (ඍ) ඡේදයේ "විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලබන;" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලබන:

එසේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් විධානයක් හේතුවෙන් මේ ඡේදයේ සඳහන් සේවා වෙනුවෙන් විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදු කිරීමෙන් අපනයනකරු වළක්වනු ලැබූ අවස්ථාවක දී, අපනයනකරු විසින් ඔහුගේ විදේශීය ව්‍යවහාර මුදල් ලැබීම් පිළිබඳව තහවුරු කිරීමක් සැපයිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපවගන්තිය සංශෝධනය කිරීම

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1අ) උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින සිට, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (1අ) උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේද ඇතුළත් කිරීමෙන්:-

"(1ආ) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වාසික හෝ නිර්වාසික පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම මත පහත දැක්වෙන අනුප්‍රමාණයන් අනුව බදු පැනවිය යුතු ය:-

(අ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හයක කාලසීමාව සඳහා බදු අය කළ හැකි ආදායම:-

| බදු අය කළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 1,500,000 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 6% |
| රු. 1,500,000 ඉක්මවන නමුත් රු. 3,000,000 නො ඉක්මවන | රු. 90,000 ක් වූ මුදලක් සහ රු. 1,500,000 ට අතිරික්ත මුදලින් 12% |
| රු. 3,000,000 ඉක්මවන | රු. 270,000 ක් වූ මුදලක් සහ රු. 3,000,000 ට අතිරික්ත මුදලින් 18%; |

(ආ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ දෙවන මාස හයක කාලසීමාව සඳහා බදු අය කළ හැකි ආදායම:-

| බදු අය කළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 250,000 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 6% |
| රු. 250,000 ඉක්මවන නමුත් රු. 500,000 නො ඉක්මවන | රු. 15,000 ක් වූ මුදලක් සහ රු. 250,000 ට අතිරික්ත මුදලින් 12% |
| රු. 500,000 ඉක්මවන නමුත් රු. 750,000 නො ඉක්මවන | රු. 45,000 ක් වූ මුදලක් සහ රු. 500,000 ට අතිරික්ත මුදලින් 18% |
| රු. 750,000 ඉක්මවන නමුත් රු. 1,000,000 නො ඉක්මවන | රු. 90,000 ක් වූ මුදලක් සහ රු. 750,000 ට අතිරික්ත මුදලින් 24% |
| රු. 1,000,000 ඉක්මවන නමුත් රු. 1,250,000 නො ඉක්මවන | රු. 150,000 ක් වූ මුදලක් සහ රු. 1,000,000 ට අතිරික්ත මුදලින් 30% |
| රු. 1,250,000 ඉක්මවන | රු. 225,000 ක් වූ මුදලක් සහ රු. 1,250,000 ට අතිරික්ත මුදලින් 36%; |

(1ඇ) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, 2023, අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා වාසික හෝ නිර්වාසික පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම මත පහත දැක්වෙන අනුප්‍රමාණයන් අනුව බදු පැනවිය යුතු ය:-

| බදු අය කළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 500,000 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 6% |
| රු. 500,000 ඉක්මවන නමුත් රු. 1,000,000 නො ඉක්මවන | රු. 30,000 ක් වූ මුදලක් සහ රු. 500,000 ට අතිරික්ත මුදලින් 12% |

| | |
|---|---|
| රු. 1,000,000 ඉක්මවන නමුත් රු. 1,500,000 නො ඉක්මවන | රු. 90,000 ක් වූ මුදලක් සහ රු. 1,000,000 ට අතිරික්ත මුදලින් 18% |
| රු. 1,500,000 ඉක්මවන නමුත් රු. 2,000,000 නො ඉක්මවන | රු. 180,000 ක් වූ මුදලක් සහ රු. 1,500,000 ට අතිරික්ත මුදලින් 24% |
| රු. 2,000,000 ඉක්මවන නමුත් රු. 2,500,000 නො ඉක්මවන | රු. 300,000 ක් වූ මුදලක් සහ රු. 2,000,000 ට අතිරික්ත මුදලින් 30% |
| රු. 2,500,000 ඉක්මවන | රු. 450,000 ක් වූ මුදලක් සහ රු. 2,500,000 ට අතිරික්ත මුදලින් 36%"; |

(ඇ) ඒ ඡේදයේ (5) වන උපඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින සිට, එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 3 වන ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, තක්සේරු වර්ෂයක් සඳහා 57 වන වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ වන භාරයක බදු අය කළ හැකි ආදායම මත -

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 18% ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 18% ක

අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඇ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

බදු පැනවිය යුතු ය.";

(3) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදයේ-

(i) ඒ උපඡේදයේ (ආ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය;";

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:-

"(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය.";

(ආ) ඒ ඡේදයේ (2අ) වන උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින සිට, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සහ 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්";

(ඇ) ඒ ඡේදයේ (2අ) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(2ආ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ, 2022 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන මාස හයක කාලසීමාව සඳහා සමාගමක බදු අය කළ හැකි ආදායමෙහි ඇතුළත් වන පහත දැක්වෙන ඒ ලැබීම් සහ ලාභ කොටස මත සහ 2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක ලැබීම් සහ ලාභ මත පහත දැක්වෙන අනුප්‍රමාණවලට අනුව බදු පැනවිය යුතු ය:-

(අ) ඔට්ටු ඇල්ලීම් සහ සූදු ක්‍රීඩා පැවැත්වීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 40%; සහ

(ආ) යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයන් නිෂ්පාදනය කොට විකිණීමෙන් හෝ ආනයනය කොට විකිණීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 40%.";

(ඈ) ඒ ඡේදයේ (4) වන උපඡේදයේ (අ) අයිතමයේ "එම ලැබීම් මත 10% ක අනුප්‍රමාණයකින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම ලැබීම් මත, 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව 10% ක අනුප්‍රමාණයකින් සහ 2022 ඔක්තෝබර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඉ) ඒ ඡේදයේ (5) වන උපඡේදයේ -

(i) ඒ උපඡේදයේ "(1) වන, (2අ) වන," යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන, (2අ) වන, (2ආ) වන," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ දෙක සඳහා" යන වචන වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(iii) ඒ උපඡේදයේ (ආ) උප- උපඡේදයේ (ii) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(ii) පළමු වර්ෂයේ පළමු මාස හයට සාපේක්ෂව 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හයේ දී (නිශ්චිත ව්‍යවසායයන් හැර) අපනයනවල සියයට පනහක වැඩිවීමක් තිබිය යුතු වීම,";

(4) ඒ උපලේඛනයේ 5 වන ඡේදයේ (1) වන උපඡේදයේ "බදු අය කළ හැකි ආදායම මත 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින් සහ 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"බදු අය කළ හැකි ආදායම මත -

(අ) 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24%ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඇ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

බදු පැනවිය යුතු ය.";

(5) ඒ උපලේඛනයේ 7 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) (2) වන උපඡේදයට යටත් ව, යම් තක්සේරු වර්ෂයක් සඳහා රාජ්‍ය නොවන සංවිධානයක බදු අය කළ හැකි ආදායම මත -

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

බදු පැනවිය යුතු ය.";

(ආ) ඒ ඡේදයේ (3) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(3) යම් රාජ්‍ය නොවන සංවිධානයක් විසින්, 68 වන වගන්තිය යටතේ ප්‍රදානයක්, පරිත්‍යාගයක් හෝ දායක මුදලක් හෝ වෙනත් යම් ආකාරයකින් යම් තක්සේරු වර්ෂයක් තුළ ලැබුණු මුදල් ප්‍රමාණ මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය-

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 28% ක් විය යුතු ය;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක් විය යුතු ය;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂයේ

පළමු මාස හය සඳහා 24% ක් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක් විය යුතු ය; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක් විය යුතු ය."; සහ

(6) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ -

(අ) ඒ උපඡේදයේ (අ) අයිතමයේ "83 වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය හෝ 83අ වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "84(1)(අ)(i) වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "84(1)(අ) වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපඡේදයේ (ඇ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(ඈ) 84අ(1අ) වගන්තිය අදාළ කරගනු ලබන ගෙවීම් සඳහා-

(i) වාසික තැනැත්තකුට කරන කුලී ගෙවීම්වල මුළු එකතුව මසකට රු. 100,000 ක් නො ඉක්මවන අවස්ථාවක දී - 0%;

(ii) ගෙවන ලද පොලිය හෝ වට්ටම සඳහා - 5%;

(iii) වාසික තැනැත්තකුට කරන කුලී ගෙවීම්වල මුළු එකතුව මසකට

රු.100,000 ක් ඉක්මවන හෝ සමාන වන අවස්ථාවක දී, මුළු මුදලෙන් - 10% ;

(iv) ලාභාංශ හැර වෙනත් සියලු ගෙවීම් සඳහා - 14%; සහ

(v) ගෙවන ලද ලාභාංශ සඳහා - 15%.";සහ

(7) ඒ උපලේඛනයේ 11 වන ඡේදයේ "වර්ෂ පහක කාලසීමාව" යන වචන වෙනුවට "වර්ෂ දෙකක කාලසීමාව" යන වචන ආදේශ කිරීමෙන්.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (6) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

"(6අ) මේ ඡේදයේ උපඡේදයක් යටතේ තමා අදහස් කරන ලද මුළු ආයෝජනය සිදු කර නොමැති යම් තැනැත්තකුට, ක්ෂය විය හැකි වත්කම් මත ආයෝජනය කරනු ලබන පළමුවන දිනයෙන් ආරම්භ වන, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වසර තුනක කාලසීමාවක් දෙනු ලැබිය යුතු ය. (6) වන උපඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ ඡේදයේ උපඡේදයක් යටතේ පැන නගින ප්‍රාග්ධන දීමනා, ඔහු විසින් අදහස් කරන ලද මුළු ආයෝජනය සම්පූර්ණ කර ඇති තක්සේරු වර්ෂය තුළ දී එහෙත් ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව, අඩු කරනු ලැබිය යුතු ය.".

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(උඋ) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකට යටත්ව, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන බවට වූ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් තීරණයක් හේතුවෙන් ඒ ලැබීම ලැබී ඇත්තේ නම්, ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කමක් හෝ

බැරකමක් උපලබ්ධි කිරීමක් වශයෙන් හෝ ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමක් වශයෙන් වූ ලැබීමක් ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුවට සම්පූර්ණයෙන්ම අයත් අස්ථිත්වයකට ලැබුණු ලැබීමක්;

(2) ඒ උපලේඛනයේ (ඌඌ) ඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ (චච) ඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව-" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ උපලේඛනයේ (චච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(චචච) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසුව -

(i) 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ විධිවිධානවලට අනුව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල නිරත වන සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් වාසික සමාගමක් විසින් ගෙවනු ලබන ලාභාංශයක්:-

(iඅ) ආනයනය කිරීම, සුළු වශයෙන් පිරිසැකසුම් කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම හා සම්බන්ධිත යම් ව්‍යාපාර කේන්ද්‍රීය වෙළඳාම;

(iආ) එක් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ එක් රටක භාණ්ඩ නිෂ්පාදනය කර එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කිරීමේ අක්වෙරළ ව්‍යාපාර;

(iඇ) විදේශයන්හි සේවාදායකයන් සඳහා අභිමුඛ සේවා සැපයීම;

(iඈ) මූල්‍ය සැපයුම් ජාලය සහ බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යාලයීය මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(iඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ බහු පාර්ශ්වීය ඒකාබද්ධ කිරීම් ඇතුළු කාර්ය සම්පාදන සේවා සිදු කිරීම;

(ii) වාසික සමාගමකට හෝ 84අ වන වගන්තියේ (1අ) වන උපවගන්තිය යටතේ අත්තිකාරම් ආදායම් බද්දට යටත් වන වෙනත් වාසික සමාගමකට ලැබුණු වෙනත් ලාභාංශයකට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට හෝ ඒ ලාභාංශයෙන් ව්‍යුත්පන්න වන ප්‍රමාණයට, වාසික සමාගමක් විසින් සාමාජිකයකු වෙත ගෙවනු ලබන ලාභාංශයක්;";

(5) ඒ උපලේඛනයේ (ඩඩ) ඡේදයේ "උපලබ්ධි කිරීමෙන් ලැබීම් ලෙස" යන වචන වෙනුවට, "උපලබ්ධි කිරීමෙන් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව ලැබීම් ලෙස" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(6) ඒ උපලේඛනයේ (ද) ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (ii) වන උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (v) වන උපඡේදයේ -

(i) ඒ උපඡේදයේ "යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයක," යන වචන වෙනුවට "යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයක, 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "වසර පහක" යන වචන වෙනුවට "වසර දෙකක" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපඡේදයේ අතුරු විධානයේ "ඉදිරි වර්ෂ හතර සඳහා ද" යන වචන වෙනුවට "ඉදිරි වර්ෂය සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ ඡේදයේ (vi) වන උපඡේදයේ "බලාත්මක වන පරිදි," යන වචන වෙනුවට "බලාත්මක වන පරිදි, 2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(7) ඒ උපලේඛනයේ (ප) ඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (ඉ) උපඡේදයේ "වෙනත් යම් මූල්‍ය ආයතනයක් අත්කර ගැනීමේ පිරිවැය ලෙස හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය ලෙස දරන වියදම," යන වචන වෙනුවට "1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වෙනත් යම් බැංකුවක්, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍ය සමාගමක් හෝ අත්කර ගැනීමේ, කොටස් වශයෙන් අත්කර ගැනීමේ, ව්‍යාපාර අන්තර්ග්‍රහණය කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය ලෙස දරන ලද වියදම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (අ) උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) (i) 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 500,000 ක්;

(ii) 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 3,000,000 ක්;

(iii) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා රු. 1,500,000 ක් සහ දෙවන මාස හය සඳහා රු. 600,000 ක්; සහ

(iv) 2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 1,200,000ක්,

එහෙත්, භාරකරුවකු, භාරගැනුම්කරුවකු, පොල්මඃකරුවකු හෝ ඈවරකරුවකු වන යම් පුද්ගලයකු ඒ භාරකරු, භාරගැනුම්කරු, පොල්මඃකරු හෝ ඈවරකරු වශයෙන් ඒ පෞද්ගලික සහනය අඩු කිරීම සඳහා හිමිකම් නොලැබිය යුතු අතර, ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් වන ලැබීම්වලින් ඒ සහනය අඩු නොකළ යුතු ය;"; සහ

(ආ) ඒ ඡේදයේ (ඊ) උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව තක්සේරු වර්ෂයක් සඳහා මුළු මුදල රු. 1,200,000 ක් දක්වා දරන ලද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව, තක්සේරු වර්ෂයක් සඳහා මුළු මුදල රු. 1,200,000 ක් දක්වා සහ 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා රු. 600,000 ක් දක්වා දරන ලද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (4) වන උපඡේදයේ (ආ) අයිතමයේ "ව්‍යාපාර ක්‍රියාවලිය හෝ ඵලදායීතාවය වර්ධනය කිරීමට භාවිතා කරනු ලබන, ව්‍යාපාර පරිශ්‍රයට සවි වී ඇති" යන වචන වෙනුවට "ව්‍යාපාර පරිශ්‍රයට සවි වී ඇති" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන සහ 11 වන ඡේද පිළිවෙළින් ඒ උපලේඛනයේ 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන සහ 9 වන ඡේද ලෙස නැවත අංක යෙදීමෙන්;

(3) ඒ උපලේඛනයේ නැවත අංක යොදන ලද 8 වන ඡේදයේ "පොලී අනුපාතිකය ශුන්‍යය විය යුතුය." යන වචන වෙනුවට "පොලී අනුපාතිකය, ඒ ගෙවීම 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලැබ ඇත්නම්, ශුන්‍යය විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ "වර්ෂ තුන" යන වචන වෙනුවට "වර්ෂ දෙක" යන වචන ආදේශ කිරීමෙන්.

2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම

**41.** (1) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, ඒ තක්සේරු වර්ෂයේ පළමු මාස හය සහ දෙවන මාස හය ලෙස කාල සීමා දෙකකට වෙන් වෙන්ව ගණනය කළ යුතු ය. ඒ ගණනය කිරීමේ කාර්යය සඳහා, ඒ තැනැත්තා විසින් ඒ කාල සීමා දෙක සඳහා වූ බදු අයකළ හැකි ආදායම ලබාගැනීමට (තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 50% ලෙස හා දෙවන මාස හය සඳහා ඉතිරි 50% ක් ලෙස) සමානුපාතික පදනම භාවිත කළ හැකි ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින් වාරික මගින් බද්ද ගෙවීමේ කාර්යය සඳහා සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**42.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

'අ' වගුව (1 වන වගන්තිය)

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *මේ පනතේ වගන්තිය* | *ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය* |
| 2 | 5 |
| 4 | 12 |
| 5 | 14 |
| 6 | 16 |
| 11 | 66 |
| 18 | 87 |
| 21 | 92අ |
| 22 | 94 |
| 23 | 120 |

| | |
|---|---|
| 25 | 133 |
| 26 | 134 |
| 27 | 135 |
| 28 | 136 |
| 35(1) සහ (3) | 195 |
| 36 (1), (2), (3), (4) සහ (5) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1අ) සහ (1ආ) උපඡේද, 3 වන, 4 වන, 5 වන සහ 7 වන ඡේද |
| 37 | දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (6අ) උපඡේදය |
| 38(1) | තුන්වන උපලේඛනයේ (උඋ) ඡේදය |
| 40(1) සහ (2) | 6 වන උපලේඛනයේ 1 වන ඡේදයේ (4) වන උපඡේදයේ (ආ) අයිතමය සහ 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන සහ 9 වන ඡේද |
| 41 | අලුත් වගන්තිය |

*'ආ' වගුව* *(1 වන වගන්තිය)*

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *මේ පනතේ වගන්තිය* | *ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය* |
| 36(1) | පළමුවන උපලේඛනයේ පළමුවන ඡේදයේ (5) වන උපඡේදය |
| 38(2),(3),(4) සහ (5) | තුන්වන උපලේඛනයේ (ඌඌ), (චච), (ඩඩ) සහ (චචච) ඡේද |
| 39(2) | පස්වන උපලේඛනයේ (2) වන ඡේදය |
| 40(3) සහ (4) | හයවන උපලේඛනයේ (8) වන සහ (10) වන ඡේද |

*'ඇ' වගුව* *(1 වන වගන්තිය)*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *මේ පනතේ වගන්තිය* | *ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය* | *ක්‍රියාත්මක වන දිනය* |
| 3 | 10 | 01.04.2021 |
| 7 | 18 | 01.04.2021 |
| 8 | 19 | 01.04.2018 |
| 9 | 46 | 01.04.2021 |
| 10 | 54 | 01.04.2018 |
| 12 | 69 | 01.04.2018 |
| 13 | 72 | 01.04.2018 |
| 14 | 73 | 01.04.2018 |
| 20 | 90 | 01.04.2021 |
| 29 | 139 | 01.04.2023 |
| 35(2) | 195 | 01.04.2020 |
| 36(1) සහ (7) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1ඇ) උපඡේදය සහ 11 වන ඡේදය | 01.04.2023 |
| 38(6) සහ (7) | තුන්වන උපලේඛනයේ (ද) සහ (ප) ඡේද | 31.03.2023 |
| 39(1) | පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (ඉ) උපඡේදය | 01.04.2021 |